අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவுச் சங்கம்
Education Co-operative Society

සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමූපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය දිවයිනේ අධ්‍යාපන සේවයේ නියුතුවූවන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර ඇති සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳව ක්‍රියාකරනු ලබන සමූපකාර සමිතියකි.

සමිතියේ ප්‍රධාන කාර්යාලයේ හා ශාඛා කාර්යාලවල පවතින මතු සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම සඳහා **බාහිර අයදුම්කරුවන්ගෙන්** ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් පහත සඳහන් පොදු කොන්දේසිවලට අදාළව සකසන ලද අයදුම්පත්‍ර 2026-11-26 දින හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් හෝ ගෙනවිත් ප්‍රධාන සභාපති වෙත ලැබෙන සේ භාරදිය යුතුය. තව ද මෙම දැන්වීමේ දැක්වෙන QRකේතය භාවිතා කර මාර්ගගත ක්‍රමයටද අයදුම් කල යුතුය. (QRකේතය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට පමණක් අයදුම් කිරීම ප්‍රමාණවත් නොවේ)

(කිළිනොච්චිය, මුලතිව්සහ මන්නාරම දිස්ත්‍රික්කවල හැර දිවයිනේ අනෙකුත් සියළු දිස්ත්‍රික්කවල ප්‍රධාන නගරයන්හි සමිතියේ ශාඛා කාර්යාල පවතී.)

මේ සඳහා කුසලතා පූර්ණ, උද්‍යෝගිමත් හා කැපවීමෙන් යුතුව වැඩකිරීමේ හැකියාව ඇති සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

ප්‍රධාන පුහුණු කිරීමේ නිලධාරී (මාණ්ඩලික සේවා අංශය SG- III ශ්‍රේණිය)

1. අධ්‍යාපන/ ව්‍යාපාර කළමනාකරණ/ මානව සම්පත් කළමනාකරණ/ සමාජ විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ පිළිගත් ආයතනයක පුහුණු කිරීමේ ක්ෂේත්‍රයේ තනතුරක වසර 02 ක පළපුරුද්ද

හෝ

2. අ.පොෙ.ස. උසස් පෙළ සාමාර්ථය සමඟ මානව සම්පත් කළමනාකරණය/ අධ්‍යාපන යන ක්ෂේත්‍රය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද

හෝ

3. බඳවා ගැනීම සිදුකරනු ලබන සමූපකාර සමිතියේ සහකාර පුහුණුකරු තනතුරේ II ශ්‍රේණියේ වසර 10 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය : මාසික 46,200 - 575 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 01

භාෂා පරිවර්තක (සිංහල/ දෙමළ) (මාණ්ඩලික සේවා අංශය SG - III ශ්‍රේණිය)

1. අ.පොෂ. උ/පෙළ සාමාර්ථය සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව අ.පොෂ. සා/පෙළ සමත්වීම සහ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ අනුමත හෝ අධිකරණ අමාත්‍යාංශය විසින් අනුමත දිවිරුම් දුන් භාෂා පරිවර්තකයකු වීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 46,200 - 575 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 01

නිවාඩු නිකේතන භාරකරු (මාණ්ඩලික සේවා අංශය SG - III ශ්‍රේණිය)

1. පිළිගත් විශ්වවිද්‍යාලයක නේවාසික කළමනාකරණය/ හෝටල් කළමනාකරණය යන විෂයන් එකක් හෝ තනතුරේ කාර්ය භාරයට අදාළ වන විෂයක් ඇතුළත් වන පරිදි උපාධිය සමඟ පිළිගත් ආයතනයක අදාළ තනතුරක වසර 02 ක පළපුරුද්ද

හෝ

2. අ.පොෂ. උ/පෙළ සාමාර්ථය සමඟ නේවාසික කළමනාකරණය/ හෝටල් කළමනාකරණය යන විෂයන් එකක් හෝ තනතුරේ කාර්ය භාරයට අදාළ වන විෂයක් ඇතුළත් වන පරිදි පිළිගත් ආයතනයක වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් සමත්වීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 46,200 - 575 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 04

අංශ ප්‍රධානී (ගිණුම්) (මාණ්ඩලික සේවා අංශය SG - III ශ්‍රේණිය)

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ/ ව්‍යාපාර කළමනාකරණ/ ගිණුම්කරණ/ මූල්‍ය පිළිබඳ උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්ද

හෝ

2. අ.පොෂ. උ/පෙළ සාමාර්ථය සමඟ පිළිගත් ආයතනයකින් ගණකාධිකරණය/ ගිණුම්කරණය/ මූල්‍ය/ බැංකුකරණය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්ද

හෝ

3. ඉහත 1,2 හි සඳහන් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්වලින් එකක් සමඟ බඳවා ගනු ලබන සමූපකාර සමිතියේ/ සංගමයේ මෙහෙයුම් සේවා අංශයේ අදාළ ක්ෂේත්‍රය හා සම්බන්ධ තනතුරක වසර 10 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 46,200 - 575 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 20

කාර්මික නිලධාරී (මෙහෙයුම් සේවා අංශය O - III ශ්‍රේණිය)

1. අ.පො.ස. උ/පෙළ සාමාර්ථය සමඟ ජාතික ආධුනිකත්ව මණ්ඩලය/ කාර්මික විද්‍යාලයක/ රජය පිළිගත් ආයතනයක කාර්මික ශිල්පය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක පළපුරුද්ද

හෝ

2. දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් අ.පො.ස. සා/පෙළ සමත්වීම සහ ජාතික ආධුනිකත්ව මණ්ඩලය/ කාර්මික විද්‍යාලයක/ රජය පිළිගත් ආයතනයක කාර්මික ශිල්පය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද

හෝ

3. අ.පො.ස. උ/පෙළ සමත්වීම සමඟ බඳවා ගැනීම සිදුකරන ආයතනයේ කාර්මික ශිල්පී තනතුරේ I ශ්‍රේණියේ සේවකයෙකු වීම

වැටුප් පරිමාණය ඃ මාසික 38,700 - 350 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 01

සේවා ප්‍රවර්ධන නිලධාරී (මෙහෙයුම් සේවා අංශය O - III ශ්‍රේණිය)

1. අ.පො.ස. උ/පෙළ සාමාර්ථය සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව අ.පො.ස. සා/පෙළ සමත්වීම සමඟ පිළිගත් ආයතනයක සාමාජික බඳවාගැනීම්/ සේවා ප්‍රවර්ධනය/ තැන්පතු ප්‍රවර්ධනය/ විශේෂ ව්‍යාපෘති ප්‍රවර්ධනය/ ණය ප්‍රවර්ධනය ආදී ක්ෂේත්‍රයේ වසරක සේවා පළපුරුද්ද

හෝ

2. දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් අ.පො.ස. සා/පෙළ සමත්වීම සහ අලෙවිකරණය හෝ ව්‍යාපාර ප්‍රවර්ධනය පිළිබඳ පිළිගත් ආයතනයකින් සහතික පත්‍ර පාඨමාලාවක් සමත්වීම සමඟ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 38,700 - 350 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 28

ග්‍රැෆික් ඩිසයිනර් (මෙහෙයුම් සේවා අංශය O - III ශ්‍රේණිය)

1. අ.පො.ස. උ/පෙළ සමත්වීම සහ පිළිගත් ආයතනයකින් ග්‍රැෆික් ඩිසයිනින් පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්ද

හෝ

2. දෙවරකට නොවැඩි වාර ගණනාවකදී විෂයන් හයකින් අ.පොෙ.ස. සා/පෙළ සමත් වීම සහ පිළිගත් ආයතනයකින් ග්‍රැෆික් ඩිසයිනින් පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 04 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 38,700 - 350 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 01

තොරතුරු තාක්ෂණ සහකාර (මෙහෙයුම් සේවා අංශය O - III ශ්‍රේණිය)

1. අ.පොෙ.ස. උ/පෙළ සාමාර්ථය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් (application and hardware) සමත්වී තිබීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

හෝ

2. තොරතුරු තාක්ෂණය පිළිබඳ (application and hardware) NVQ 4 මට්ටමේ සහතිකයක් ලබාතිබීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 38,700 - 350 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 10

කළමනාකරණ සේවා නිලධාරී (ගිණුම්) (මෙහෙයුම් සේවා අංශය O- III ශ්‍රේණිය)

1. අ.පොෙ.ස. උ/පෙළ වාණිජ විෂය ධාරාවෙන් සමත්වීම සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, භාෂාව සමඟ ඉංග්‍රීසි ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව අ.පොෙ.ස. සා/පෙළ සමත්වීම

හෝ

2. අ.පොෙ.ස. සා/පෙළ ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව සමත්වීම සමඟ AAT 2 වන අදියර සමත්වීම හෝ වරලත් ගණකාධිකරණ ප්‍රථම අදියර සමත්වීම

හෝ

3. අ.පොෙ.ස. උ/පෙළ වාණිජ විෂය ධාරාවෙන් සමත්වීම සමඟ කාර්යාල කාර්ය සහායක තනතුරේ I ශ්‍රේණියේ වසර 05 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 38,700 - 350 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 129

කළමනාකරණ සේවා නිලධාරී (මෙහෙයුම් සේවා අංශය O- III ශ්‍රේණිය)

1. අ.පොෙ.ස. උ/පෙළ සාමාර්ථය සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව අ.පොෙ.ස. සා/පෙළ සමත්වීම

හෝ

2. අ.පොෙ.ස. උ/පෙළ සාමාර්ථය සහ කාර්යාල කාර්ය සහායක තනතුරේ I ශ්‍රේණියේ වසර 05 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 38,700 - 350 X 10.

පුරප්පාඩු සංඛ්‍යාව - 98

අයකැමි (මෙහෙයුම් සේවා අංශය O- III ශ්‍රේණිය)

1. අ.පොෙ.ස. උ/පෙළ සාමාර්ථය සමඟ අ.පොෙ.ස. සා/පෙළ ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව සමත්වීම

හෝ

2. අ.පොෙ.ස. උ/පෙළ සාමාර්ථය සමඟ අදාළ තනතුරේ වසර 03 ක පළපුරුද්ද

හෝ

3. අ.පොෙ.ස. සා/පෙළ ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව සමත්වීම සමඟ අදාළ තනතුරේ වසර 05 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 38,700 - 350 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 17

සූපවේදී (මෙහෙයුම් සේවා අංශය O- III ශ්‍රේණිය)

1. අ.පොෙ.ස. උ/පෙළ සාමාර්ථය සමඟ රජයේ හෝ රජය පිළිගත් හෝටල් පාසලක අදාළ ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්ද

හෝ

2. දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් අ.පොෙ.ස. සා/පෙළ සමත් වීම සහ රජයේ හෝ රජය පිළිගත් හෝටල් පාසලක අදාළ ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පාඨමාලාවක් සමත්වීම සමඟ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්ද

හෝ

3. අ.පොෙ.ස. උ/පෙළ සාමාර්ථය සමඟ බඳවා ගැනීම සිදුකරනු ලබන සමූපකාර සංගමයේ/ සමිතියේ සූපවේදී සහායක තනතුරේ වසර 10 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 38,700 - 350 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 05

කාර්මික ශිල්පී (සහාය සේවා අංශය S.1- II ශ්‍රේණිය)

1. අ.පොෙ.ස. සා/පෙළ සමත් වීම සහ පිළිගත් ආයතනයකින් කාර්මික කටයුතු සම්බන්ධ සහතික පත්‍ර පාඨමාලාවක් සමත්වී තිබීම සමඟ අදාළ තනතුරේ වසරක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 35,100 - 290 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 02

රියදුරු (සහාය සේවා අංශයS.1- II ශ්‍රේණිය)

1. අ.පොා.ස. සා/පෙළ විෂයන් 06 කින් සමත්වීම සමඟ වසර 03ක් පැරණි බර වාහන බලපත්‍රය සහිතව රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 35,100 - 290 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 03

කාර්යාල කාර්ය සහායක (සහාය සේවා අංශයS.1- II ශ්‍රේණිය)

1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පොා.ස. සා/පෙළ සමත්වීම

වැටුප් පරිමාණය ඃ මාසික 35,100 - 290 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 20

පිළිගැනීමේ නිලධාරී (සහාය සේවා අංශයS.1- II ශ්‍රේණිය)

1. දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ඉංග්‍රීසි විෂයට සම්මාන සහිතව අ.පොා.ස. සා/පෙළ සමත්වීම

වැටුප් පරිමාණය ඃ මාසික 35,100 - 290 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 27

ලේඛණ භාරකරු (සහාය සේවා අංශයS.1- II ශ්‍රේණිය)

1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පොා.ස. සා/පෙළ සමත්වීම සමඟ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

වැටුප් පරිමාණය ඃ මාසික 35,100 - 290 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 36

නිවාඩු නිකේතන සහායක (සහාය සේවා අංශයS.2- II ශ්‍රේණිය)

1. අ.පොා.ස. සා/පෙළ සමත් වීම

වැටුප් පරිමාණය ඃ මාසික 33,500 - 250 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 08

කම්කරු (සහාය සේවා අංශයS.3- II ශ්‍රේණිය)

1. 10 ශ්‍රේණිය සමත්වීම

වැටුප් පරිමාණය ඃ මාසික 30,100 - 180 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 33

<u>පොදු කොන්දේසි</u>

- අයදුම්කරුවන් වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. නමුත් දැනට සමුපකාර සේවයේ යෙදී සිටින අයෙකුට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.
- ඉහත සඳහන් තනතුරට අදාළ මාසික වැටුපට අමතරව රු.17,800/-ක ජීවන වියදම් දීමනාවද, අනුමත රු.11,000/-දීමනාවද හිමි වනු ඇත.
- මෙම තනතුර ස්ථිරය. නමුත් විශ්‍රාම වැටුප් රහිතය. පත්වීම්ලාභියෙකු සඳහා සේවක අර්ථසාදක අරමුදල වෙනුවෙන් 10%ක් ගෙවිය යුතු අතර, ආයතනයෙන් 15% ක් බැර කෙරෙනු ඇත.
- අයදුම්කරුවන් ජීව දත්ත සහ සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් ඇතුළත්ව තමා විසින්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කරගත් ජීවදත්ත පත්‍රිකාවක් සමඟ මෙහි සඳහන් අයදුම්පත්‍ර ආකෘතිය අනුව සකස් කර ගත් අයදුම්පත්‍රයක්ද සම්පූර්ණ කර ඉල්ලුම් කළ යුතුය.